# ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය
# டிஜிட்டல் பொருளாதார அமைச்சு
# Ministry of Digital Economy

1101, 11 වන මහල, වන් ගෝල් ෆේස්, # 1ඒ, මැද පාර, කොළඹ 02
1101, 11 வது மாடி, வந் கோல் பேஸ், # 1A, சென்டர் வீதி, கொழும்பு 02
Unit 1101, 11th Floor, One Galle Face Tower, # 1A, Centre Road, Colombo 02

/modesrilanka
mode.gov.lk


## මාධ්‍ය නිවේදනය

## පුද්ගලික දත්ත ආරක්ෂණ පනත බලාත්මක කිරීමට පෙර පාර්ශවකරුවන් පෙළගැස්වීම හා නියාමනය ශක්තිමත් කිරීමේ සංශෝධන සඳහා අමාත්‍ය මණ්ඩලය අනුමැතිය

ඩිජිටල් ක්‍රමෝපායන් අනුගමනය කිරීමට රාජ්‍ය අංශය මෙන්ම පෞද්ගලික අංශය ද එක හා සමානව සහය දක්වන අනාගත පාලන ක්‍රමවේදයක් තිබීමේ වැදගත්කම හඳුනා ගනිමින්, දත්ත විෂයයන් හෙවත් පුරවැසියන් හා සෙසු ආයතනවල අයිතීන් අර්ථවත්ව සුරක්ෂිත කිරීමේ හැකියාවෙන් යුත් අංගසම්පූර්ණ නියාමන ආයතනයක් පිහිටුවීමට සහාය වීමේ අවශ්‍යතාවය සලකා බලා 2022 අංක 9 දරන පුද්ගලික දත්ත ආරක්ෂණ පනත සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීමට පෙර එම පනතට සංශෝධන එක් කිරීමට යෝජනා කරමින් ඩිජිටල් ආර්ථික අමාත්‍යවරයා ලෙස ජනාධිපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද සංදේශයක් අමාත්‍ය මණ්ඩලය විසින් 2025 පෙබරවාරි 19 වන දින අනුමත කරන ලදී.

දකුණු ආසියාවේ මෙවැනි ආකාරයේ ප්‍රථම නීති සම්පාදනය වන මෙම පනත, ඩිජිටල් ආර්ථිකයේ වර්ධනයට සහ නවෝත්පාදනයට පහසුකම් සලස්වන අතරම පුරවැසියන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ ප්‍රධාන පියවරකි. මෙම සංශෝධන සැලසුම් කර ඇත්තේ මෙම සුවිශේෂී නීතිය ශක්තිමත් කිරීම සඳහා වන අතර, එය සමාජයේ සෑම අංශයක් හරහාම සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීමට සහ වඩාත් පුළුල් තාක්ෂණික තේරීම් අත්පත් කර ගැනීමට ආයතනවලට ඇති අවස්ථා සහතික කරයි. දත්ත ආරක්ෂණ අධිකාරිය (DPA) විසින් මෙතෙක් ප්‍රකාශයට පත් කරන ලද කෙටුම්පත් රීති, කෙටුම්පත් රෙගුලාසි, කෙටුම්පත් විධාන සහ කෙටුම්පත් මාර්ගෝපදේශවලට රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය සහ අනෙකුත් ප්‍රධාන පාර්ශවකරුවන්ගේ අවධානය යොමුවීමෙන් පසු ලද වටිනා ප්‍රතිපෝෂණ යෝජිත සංශෝධනවල ඇතුළත් වේ.

මෙම පනතට අනුකූල වීමට සූදානම් වීමේ දී මානව සම්පත් සහ තාක්ෂණික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට අමතර කාලයක් අවශ්‍ය බව විශේෂයෙන්ම රාජ්‍ය අංශයේ ආයතන ඇතුළු බොහෝ පාර්ශ්වකරුවන් ප්‍රකාශ කර ඇති අතර, මෙම සංශෝධන මගින් ඔවුන්ට පනතේ බලාත්මක කිරීමේ විධිවිධානවලට සම්පූර්ණයෙන්ම අනුකූල වීමට අවස්ථාව ලැබේ. විශේෂයෙන් රාජ්‍ය අංශය විසින් තාක්‍ෂණික තේරීම් සිදුකිරීමේ දී ඔවුන්ට පුද්ගලික අංශයට සමානව වඩාත් නම්‍යශීලීතාවක් ලබා දීම සඳහා මෙන්ම කෘත්‍රිම බුද්ධි (AI) පද්ධති යනාදිය අන්තර්ගත කිරීමට හැකි වන පරිදි ඇතැම් රාජ්‍ය ආයතන මෙම පනතට සංශෝධන යෝජනා කර ඇත. මෙම නීතිය මධ්‍යම රජයට මෙන්ම පළාත් සභා, පළාත් පාලන ආයතන, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ග්‍රාම නිලධාරී මට්ටමට ද අදාළ වන බව සළකා රාජ්‍ය අංශයේ පුළුල් ධාරිතාවක් ඇති කිරීමේ අවශ්‍යතාවය අවබෝධ කරගෙන අතර, එම නිසා පනතට අනුකූල වීම සහතික කිරීම සඳහා පොදුවේ අමතර කාලයක් ලබා දීමට රජය අදහස් කරයි.

එබැවින් දැනට 2024 ජනවාරි 8 වැනි දින නිකුත් කරන ලද අංක 2366/08 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව 2025 මාර්තු 18 වැනි දින වශයෙන් නියම කර ඇති පනත බලාත්මක කිරීම ආරම්භක දිනය වෙනුවට අතිරේක කාලයක් ලබා දීම සඳහා මෙම සංශෝධන එකතු කිරීම අවශ්‍ය වේ. නිසි ලෙස සලකා බැලීමෙන් පසුව, යෝජිත සංශෝධන සම්පූර්ණයෙන් අන්තර්ග්‍රහණය කිරීමට සහ සියලු පාර්ශ්වකරුවන් එම පනතට අනුගත වීමට හොඳින් සූදානම්ව සිටින බව සහතික කිරීමට වැඩි කාලයක් ලබා දෙමින්, බලාත්මක කිරීමේ දිනය අවම වශයෙන් තවත් මාස හයක් (06) වන තෙක් දීර්ඝ කිරීමට අමාත්‍ය මණ්ඩලය යෝජනා කර ඇත. අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද පුද්ගලික දත්ත ආරක්ෂණ පනතෙහි යෝජිත සංශෝධන මගින් පනත බලාත්මක කිරීමේ විධිවිධාන ක්‍රියාත්මක වන දිනය දීර්ඝ කිරීමට හැකි වනු ඇත. දත්ත ආරක්ෂණ අධිකාරිය සහ නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය විසින් කෙටුම්පත් කරන ලද 17, 19, 20, 24, 26, 27, 53 සහ 56 වැනි වගන්ති ඇතුළු අනෙකුත් සංශෝධන ද අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී. මෙම සංශෝධන පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට රජය මේ වන විට කටයුතු කරමින් සිටින අතර, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය විසින් එම සංශෝධන ඉදිරියේ දී නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබේ.

**වරුණ ශ්‍රී ධනපාල**
**වැඩබලන ලේකම්**
**ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය**